# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව

+94 11 2477424 / +94 11 2477421 +94 11 2346304

communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA


| | |
|---|---|
| නිකුත් කළේ | සන්නිවේදන දෙපාර්තමේන්තුව |
| දිනය | 2026.03.31 |

## කොළඹ පාරිභෝගික මිල දර්ශකය මත පදනම් වූ මතුපිට උද්ධමනය 2026 මාර්තු මාසයේ දී ඉහළ ගියේය

කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (කො.පා.මි.ද., 2021=100)[1] වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය 2026 මාර්තු මාසයේ දී ඉහළ ගියේය. ඒ අනුව, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත මතුපිට උද්ධමනය 2026 පෙබරවාරි මාසයේ දී වාර්තා වූ සියයට 1.6ට සාපේක්ෂව 2026 මාර්තු මාසයේ දී සියයට 2.2ක් ලෙස වාර්තා විය.

| උද්ධමනය කො.පා.මි.ද., (2021=100) | 2026 පෙබරවාරි | 2026 මාර්තු |
|---|---|---|
| දර්ශක අගය | 195.3 | 195.8 |
| මාසික වෙනස (%) | -0.9 | 0.3 |
| වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය (%) | 1.6 | 2.2 |

කො.පා.මි.ද. (2021=100) මාසික % වෙනස සඳහා දායකත්වය




වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, ආහාර උද්ධමනය 2026 පෙබරවාරි මාසයේ දී වාර්තා වූ සියයට 0.2හි සිට 2026 මාර්තු මාසයේ දී සියයට 0.7 දක්වා ඉහළ ගියේය. මේ අතර, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, ආහාර නොවන උද්ධමනය 2026 පෙබරවාරි මාසයේ දී වාර්තා වූ සියයට 2.3හි සිට 2026 මාර්තු මාසයේ දී සියයට 2.9 දක්වා ඉහළ ගියේය.

මාසික පදනම මත, කොළඹ පාරිභෝගික මිල දර්ශකය 2026 මාර්තු මාසයේ දී සියයට 0.25ක ඉහළ යෑමක් වාර්තා කළේය. මෙම ඉහළ යෑම සඳහා ආහාර නොවන කාණ්ඩය ප්‍රතිශතාංක 0.52කින් දායක වූ අතර, ඒ සඳහා ප්‍රධාන වශයෙන් ප්‍රවාහන උප කාණ්ඩයේ මිල ගණන් ඉහළ යෑම හේතු විය. ආහාර කාණ්ඩය මෙම වැඩිවීමට ප්‍රතිශතාංක -0.27කින් දායක විය.

මේ අතර, ආර්ථිකයේ යටිදැරි උද්ධමන ප්‍රවණතා පිළිබිඹු කරන මූලික උද්ධමනය ද, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 2026 පෙබරවාරි මාසයේ දී වාර්තා වූ සියයට 2.1හි සිට 2026 මාර්තු මාසයේ දී සියයට 2.5 දක්වා ඉහළ ගියේය.

2026 වසරේ පළමු කාර්තුව සඳහා වාර්තා වූ කාර්තුමය සාමාන්‍ය මතුපිට උද්ධමනය ශ්‍රී ලංකා මහ බැංකුවේ මෑතකාලීන උද්ධමන පුරෝකථන සමඟ පුළුල් ලෙස අනුකූල වේ. පවතින භූ-දේශපාලනික අවිනිශ්චිතතා මධ්‍යයේ, නවතම දත්ත සහ උපකල්පන මත පදනම්ව 2026 මාර්තු මාසයේ දී පැවති මුදල් ප්‍රතිපත්ති වාරයේදී සිදු කරන ලද උද්ධමන පුරෝකථන මගින්, කලින් අපේක්ෂා කළාට වඩා පෙර, 2026 වසරේ දෙවන කාර්තුවේ දී උද්ධමනය සියයට 5ක ඉලක්කය කරා ළඟා වනු ඇතැයි පෙන්නුම් කරයි. ඉන් අනතුරුව, සුදුසු ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගවල සහාය ඇතිව, උද්ධමනය ඉලක්කගත මට්ටම වටා ස්ථායීව පවතිනු ඇතැයි පුරෝකථනය කෙරේ.

**මතුපිට උද්ධමනයේ පුරෝකථන(අ)**
**කොළඹ පාරිභෝගික මිල දර්ශකය,(ආ) කාර්තුමය සාමාන්‍යය, වාර්ෂික ලක්ෂ්‍යමය**
**2026 මාර්තු මස මුදල් ප්‍රතිපත්ති වාරයේ පුරෝකථන මත පදනම්ව**




(අ) **සටහන: පුරෝකථනයක් යනු පොරොන්දුවක් හෝ බැඳීමක් නොවේ.** උද්ධමන ව්‍යාප්ති සටහන (Fan Chart) මගින් මූලික පුරෝකථන පථය වටා පවතින අවිනිශ්චිතතාව ක්‍රමයෙන් වර්ණය අඩු වන පරිදි වූ විශ්‍රම්භ පරාස භාවිත කරමින් විදහා දැක්වේ. මෙහි පෙන්වා දී ඇති උද්ධමන ව්‍යාප්ති සටහනෙහි දක්වා ඇති පුරෝකථන මගින් 2026 වසරේ මාර්තු මාසයේ පුරෝකථන වාරයේ දී පැවති දත්ත, උපකල්පන හා විනිශ්චයන් පිළිබිඹු කෙරේ. මැදපෙරදිග කලාපයේ පවතින අර්බුදයේ නිරන්තර වෙනස්වන ස්වභාවය සහ ගෝලීය මෙන්ම දේශීය ආර්ථික ක්‍රියාකාරකම් කෙරෙහි එමගින් ඇතිවන පුළුල් බලපෑම් මධ්‍යයේ, වත්මන් උද්ධමන ඉදිරි දැක්ම සඳහා ඉහළ අවිනිශ්චිතතාවක් පවතී. ඒ අනුව, පුරෝකථන සඳහා පදනම් වූ තත්ත්වයන්හි සැලකිය යුතු වෙනස්කම් සිදුවුවහොත් මෙම පුරෝකථනවලින් සැලකිය යුතු අපගමනයක් සිදු විය හැකිය.

(ආ) උද්ධමන ව්‍යාප්ති සටහනෙහි වාර්තා කරන ලද දත්ත කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2021=100, ඍතුමය වශයෙන් ඇතිවන බලපෑම් ඉවත් කරන ලද) මත පදනම් වේ. එම සියලුම ප්‍රකාශිත දත්ත මත පුරෝකථන පදනම් වේ.

*§ 2023 වසරේ ඔක්තෝබර් මාසයේ දී මහ බැංකුව සහ මුදල් අමාත්‍යවරයා අතර අත්සන් කරන ලද මුදල් ප්‍රතිපත්ති රාමු ගිවිසුම යටතේ උද්ධමන ඉලක්කය (5%) සඳහා එකඟ වී ඇත.*

***මූලය: ශ්‍රී ලංකා මහ බැංකු කාර්යමණ්ඩල පුරෝකථන***

[1] කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද., 2021=100), ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරනු ලබන අතර එමගින් කොළඹ දිස්ත්‍රික්කයේ නාගරික ප්‍රදේශවල කුටුම්බ විසින් මිලදී ගන්නා භාණ්ඩ හා සේවාවල මිලෙහි සාමාන්‍ය වෙනස්වීම් පෙන්නුම් කරනු ලබයි.

## උප කාණ්ඩ අනුව කො.පා.මි.ද. (2021=100) මත පදනම් වූ මතුපිට උද්ධමනය
## (වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස)




## කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (2021=100) හැසිරීම

| කාලපරිච්ඡේදය | | දර්ශක අගය | | මාසික % වෙනස | | වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස | | වාර්ෂික සාමාන්‍ය % වෙනස | |
|---|---|---|---|---|---|---|---|---|---|
| වසර | මාසය | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) |
| 2025 | මාර්තු | 191.6 | 178.6 | -0.3 | 0.1 | -2.6 | 0.7 | -0.8 | 2.8 |
| | අප්‍රේල් | 191.2 | 178.8 | -0.2 | 0.1 | -2.0 | 0.8 | -1.1 | 2.6 |
| | මැයි | 192.8 | 179.2 | 0.8 | 0.2 | -0.7 | 1.2 | -1.2 | 2.4 |
| | ජූනි | 194.5 | 180.1 | 0.9 | 0.5 | -0.6 | 1.5 | -1.4 | 2.1 |
| | ජූලි | 194.1 | 180.8 | -0.2 | 0.4 | -0.3 | 1.6 | -1.6 | 1.9 |
| | අගෝස්තු | 193.3 | 180.9 | -0.4 | 0.1 | 1.2 | 2.0 | -1.5 | 1.8 |
| | සැප්තැම්බර් | 193.7 | 181.2 | 0.2 | 0.2 | 1.5 | 2.0 | -1.4 | 1.7 |
| | ඔක්තෝබර් | 193.8 | 181.4 | 0.1 | 0.1 | 2.1 | 2.2 | -1.2 | 1.6 |
| | නොවැම්බර් | 193.4 | 181.3 | -0.2 | -0.1 | 2.1 | 2.4 | -0.8 | 1.6 |
| | දෙසැම්බර් | 195.8 | 181.8 | 1.2 | 0.3 | 2.1 | 2.7 | -0.5 | 1.6 |
| 2026 | ජනවාරි | 197.0 | 182.5 | 0.6 | 0.4 | 2.3 | 2.3 | 0.0 | 1.7 |
| | පෙබරවාරි | 195.3 | 182.3 | -0.9 | -0.1 | 1.6 | 2.1 | 0.5 | 1.8 |
| | මාර්තු | 195.8 | 183.0 | 0.3 | 0.4 | 2.2 | 2.5 | 0.9 | 2.0 |

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

සටහන: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවට අනුව වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය සහ මාසික වෙනස, වටයන ලද දර්ශකාංක භාවිතා කර ගණනය කර ඇත.